සියලුම හිමිකම් ඇවිරිණි.
All Right Reserved

'බෝවිටියා මල් යාය'ඉගෙනුම් නිපුණතා සංවර්ධන වැඩසටහන - 2025

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව





5 ශ්‍රේණිය

I පත්‍රය

කාලය:- පැය එකයි.

ගුරුවරුන්ගේ භාවිතය සඳහා පමණි.
මෙහි කිසිවක් නොලියන්න.

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරෙන්	

නිපුණතා සංවර්ධන පෙරහුරුවට පෙනී සිටින ඔබට උපදෙස්

ඔබේ නම මෙම කොටුව තුළ ඇති තින් ඉර මත ලියන්න.

නම :- .....

- මෙම පෙරහුරු පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.

ජාතික මට්ටමේ විභාගයකට ප්‍රථම වරට පෙනී සිටින පුංචි ඔබේ නිපුණතා සංවර්ධනය සඳහා පිදෙන තිළිණයකි.

● පහත දී ඇති රූප නිරීක්ෂණය කර අංක 1 සහ 2 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. පහත රූපය නිරීක්ෂණය කරන්න. රූපය ඇසුරෙන් වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.




(1) සඳුන් චාමරට සවන් දෙයි.


(2) සඳුන් සහ චාමර අහස නිරීක්ෂණය කරති.


(3) ළමයෙක් පොතක් බලන දෙස තවත් ළමයෙක් බලා සිටියි.

2. පහත රූපයෙහි A හා B ලෙස සටහන් කර ඇති ගිස්තැන් සඳහා පිළිවෙළින් ගැළපෙන රූප කොටස් තෝරන්න.





(1)


(2)


(3)

3. පහත සටහනෙහි හිස් කොටුවට ගැළපෙන රූපය කුමක් ද?



(1) 

(2) 

(3) 

4. පහත කවියෙන් කියවෙන්නේ කුමක් ගැන ද?

කුරුල්ලෙකු නොවේ අහසේ පාවෙනවා
විවිධ වර්ණයෙන් හැඩ වී උඩ යනවා
පාවෙන සීමාව බිම සිට පෙන්වනවා
සුළඟ නැති උනොත් පොළොවට ළංවෙනවා

(1) ගුවන් යානය (2) වලාකුළ (3) සරුංගලය


5. මතීෂගේ තාත්තාගේ සහෝදරයාගේ පුතා මහිම ය. මහිම යනු මතීෂගේ,

(1) මාමාගේ පුතා ය. (2) බාප්පාගේ පුතා ය. (3) මස්සිනාගේ පුතා ය.

6. භාජනයක එක ම වර්ගයේ සහ එක ම ප්‍රමාණයේ රතු පෑන් 6 ක් ද, නිල් පෑන් 4 ක් ද, කළු පෑන් 8 ක් ද ඇත. මෙම භාජනය දෙස නොබලා සැම වර්ගයකින් ම පෑන් දෙක බැගින් ස්ථිරව ම ගැනීමට නම් භාජනයෙන් පිටතට ගත යුතු මුළු පෑන් ගණන කීය ද?

(1) 16 (2) 6 (3) 12


7. පහත A,B,C ලෙස දී ඇති ඝනක හැඩති ලී කුට්ටි තුනෙහි ඇඳ ඇති තිත් ඉරි දිගේ කපයි. එවිට එක් එක් ලී කුට්ටියෙන් ලැබෙන කැබලි දෙකෙහි සමචතුරස්‍රාකාර මුහුණත් හා සෘජුකෝණාස්‍රාකාර මුහුණත් ගණන අතර වෙනස දෙකක් වන්නේ කුමන ලී කුට්ටියේ ද?



(1) A (2) B (3) C

8. සීයා ඉපදුණේ එක්තරා වර්ෂයක ජූනි මාසයේ අවසාන සඳුදා දිනයේ ය. ආච්චි ඉපදුණේ එම වර්ෂයේ ජූලි මාසයේ පළමුවන සඳුදා දිනයේ ය. මෙම දින දෙකෙහි එකතුව 35 කි. සීයාගේ උපන් දිනය ජූනි මාසයේ,

(1) 29 දින වේ. (2) 30 දින වේ. (3) 28 දින වේ.

9. 

රූපයේ දැක්වෙන ලී කොටය CD රේඛාවෙන් කපා වෙන් කළ විට ලැබෙන මුහුණත් දෙක පිළිබඳ ව කියවෙන නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) A කොටසේ කැපුම් මුහුණතට වඩා B කොටසේ කැපුම් මුහුණත විශාල ය.
(2) B කොටසේ කැපුම් මුහුණතට වඩා A කොටසේ කැපුම් මුහුණත විශාල ය.
(3) A කොටසේ කැපුම් මුහුණත B කොටසේ කැපුම් මුහුණතට සමාන ය.

10. 2015 වසරේ අග භාගයේ උපන් නෙතුන්ට වඩා නෙතුන්ගේ අක්කා අවුරුදු දෙක හමාරකින් වැඩිමල් වේ. නෙතුන්ගේ අක්කා ඉපදුණේ,

(1) නිසැකව ම 2012 වර්ෂයේ ය. (2) නිසැකව ම 2013 වර්ෂයේ ය. (3) නිසැකව ම 2011 වර්ෂයේ ය.


11. නිමල්ගේ නංගිට සහෝදරියන් කිසිවෙකුත් නොමැති අතර එක් සහෝදරයෙක් සිටී. නිමල්ට සිටින සහෝදර සහෝදරියන් ගණන පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) 0 සහ 1 වේ. (2) 1 සහ 1 වේ. (3) 1 සහ 0 වේ.

12. දිනුකි සහ විනුකිගේ වයස්වල එකතුව අවුරුදු 22 කි. මේ දෙදෙනාගේ වයස්වල එකතුව අවුරුදු 30 ක් වන්නේ තව අවුරුදු කීයකින් ද?

(1) අවුරුදු 4 කින් (2) අවුරුදු 8 කින් (3) අවුරුදු 10 කින්

13. කිසියම් තරගයක් සඳහා බිම අඳින ලද සෘජුකෝණාස්‍රාකාර කොටුවක මුලු හතරෙහි නිල්, රතු, කහ සහ කොළ කොඩි 4 ක් සිටුවා ඇත. එම කොඩි සිටුවා ඇත්තේ පහත පරිදි ය.




- කොළ කොඩියට උතුරින් නිල් කොඩියක්
- නිල් කොඩියට බටහිරින් කහ කොඩියක්
- කහ කොඩියට ගිහිකොන දෙසින් කොළ කොඩියක් ලෙස ය.

ඒ අනුව රතු කොඩිය සිටුවා තිබෙන්නේ පිළිවෙළින් කහ කොඩියට හා කොළ කොඩියට කුමන දිශාවෙන් ද?


(1) නිරිත , බටහිර (2) දකුණ, බටහිර (3) වයඹ, දකුණ

14. පහත දැක්වෙන්නේ පහ ශ්‍රේණියේ ඉගෙනුම ලබන නිමාලි නිවසේ සිට පාසලට පැමිණෙන ගමන් මාර්ගයයි. පාසල නිම වී ඇය නිවසට එන විට ඇයගේ දකුණු අත පැත්තෙන් සෙවණැල්ල පෙනෙන වාර ගණන කීය ද?



(1) 3
(2) 4
(3) 2

15. පහත හිස්තැනට ආ යුතු සංඛ්‍යාව කීය ද?



(1) 12 (2) 13 (3) 14

16. නිමාලි, විමාලි, දිමාලි, තිමාලි යන සිව් දෙනා සවස් කාලයේ බංකුවක වාඩි වී සිටිති. එහි දී නිමාලිගේ සෙවණැල්ල ඇගේ වම් අත පැත්තෙන් ද විමාලිගේ සෙවණැල්ල ඇගේ දකුණු අත පැත්තෙන් ද, තිමාලිගේ සෙවණැල්ල ඇගේ දකුණු අත පැත්තෙන් ද දිමාලිගේ සෙවණැල්ල ඇගේ වම් අත පැත්තෙන් ද වැටී තිබුණි. මේ අනුව ඔවුන්ගෙන් උතුරු දිශාව බලා වාඩි වී සිටියේ,

(1) තිමාලි සහ විමාලි ය. (2) දිමාලි සහ නිමාලි ය. (3) දිමාලි සහ විමාලි ය.


17. වට්ටියක සුදු මල්, කහ මල් සහ රතු මල් ඇත. 6 ක් හැර ඉතුරු මල් සියල්ල රතු පාට මල් වේ. 6 ක් හැර ඉතුරු මල් සියල්ල සුදු පාට මල් වේ. 6 ක් හැර ඉතුරු මල් සියල්ල කහ පාට මල් වේ. මෙම වට්ටියේ ඇති මල් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සැම මල් වර්ගයකින් ම මල් 6 බැගින් ඇත.
(2) සැම මල් වර්ගයකින් ම මල් 3 බැගින් ඇත.
(3) කහ මල් හැර ඉතුරු මල් වර්ග දෙකෙන් මල් 6 බැගින් ඇත.

18. වෘත්තාකාර පිට්ටනියක් වටා කොඩි කණු 20 ක් සිටුවා ඇත. සෑම කණු දෙකක් අතර ම පරතරය මීටර 10 කි. පළමු කොඩි කණුවේ සිට අවසාන කොඩි කණුවට, කොඩි කණු සිටුවා ඇති ගමන් මාර්ගය ඔස්සේ දක්ෂිණාවර්තව ගමන් කරන්නෙකු ගමන් කරන දුර කොපමණ ද?


(1) මීටර 200 (2) මීටර 180 (3) මීටර 190

19.




1 අවස්ථාව 2 අවස්ථාව 3 අවස්ථාව 4 අවස්ථාව

මෙහි 6 වන අවස්ථාවට ආ යුතු රූපය කුමක් ද?



(1) (2) (3)

20.



රූපයේ දැක්වෙන හැඩතලයන් තුන වෙන වෙන ම ගත් විට එක් එක් හැඩතලය තුළ ඇති සංඛ්‍යාවල එකතුව සමාන ය. ඒ අනුව හිස්තැනට ආ යුතු සංඛ්‍යාව කුමක් ද?

(1) 5 (2) 4 (3) 6

21. ටැංකියක පතුලට සවි කර ඇති කරාමයකින් ලීටර10 බැගින් වූ ගැලුම් 4 කට වතුර පුරවයි. පෙර ගැලුම පුරවන්නට ගතවන වේලාව මෙන් දෙගුණයක වේලාවක් ඊට පසු ගැලුම පුරවන්නට යයි. ගැලුම් හතර පුරවන්නට ගිය කාලය මිනිත්තු 30 නම් පළමු ගැලුම හා අවසාන ගැලුම පුරවන්නට ගිය කාලය පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මිනිත්තු 16 හා මිනිත්තු 2 යි.
(2) මිනිත්තු 2 සහ මිනිත්තු 16 යි.
(3) මිනිත්තු 8 සහ මිනිත්තු 16 යි.

22. බිස්කට් 5 බැගින් අසුරන ලද කුඩා පෙට්ටි 10 බැගින් ඇති පෙට්ටි 10 ක් ලොකු පෙට්ටියක අසුරන ලදී. ලොකු පෙට්ටිය තුළ ඇති බිස්කට් ගණන හා කුඩා බිස්කට් පෙට්ටි ගණන ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) බිස්කට් 500 ක් හා කුඩා බිස්කට් පෙට්ටි 20 ක්.
(2) බිස්කට් 50 ක් හා කුඩා බිස්කට් පෙට්ටි 10 ක්.
(3) බිස්කට් 500 ක් හා කුඩා බිස්කට් පෙට්ටි 100 ක්.

23.



මෙම තරාදිය සහ 1kg පඩිය පමණක් දී ඇති විටෙක දී එය භාවිත කර සීනි 750g බරක් මැන ගැනීම සඳහා තරාදියට සීනි දැමිය යුතු අවස්ථා ගණන කීය ද?

(1) 4 යි. (2) 2 යි. (3) 3 යි.


24. සුපිත්, විපිත්, අපිත් යන තිදෙනා තරගයට හඳුා පිඹිති. සුපිත් විනාඩියකට එක් වරක් ද, විපිත් විනාඩි 2 කට තුන් වරක් ද, අපිත් විනාඩි 3 කට හතර වරක් ද හඳුා පිඹිති. මේ තිදෙනා එකවර හඳුා පිඹීම ආරම්භ කළේ නම් හඳුා හඬවල් 46 ක් ඇසුණේ හඳුා පිඹීම ආරම්භ කර මිනිත්තු කීයකට පසුව ද?

(1) මිනිත්තු 10 යි. (2) මිනිත්තු 12 යි. (3) මිනිත්තු 15 යි.


25. කමල් A නැමැති ස්ථානයෙන් ගමන් ආරම්භ කර කියවර 10 ක් ඉදිරියට ගොස් කියවර 5 ක් ආ පස්සට පැමිණ නතර වෙයි. නැවත ආ පස්සට පැමිණ නතර වූ ස්ථානයේ සිට කියවර 10 ක් ඉදිරියට ගොස් නැවත කියවර 5 ක් ආ පස්සට පැමිණෙයි. මෙලෙස කියවර 75 ක් ඉදිරියට ගා පසු පසට ගමන් කර කමල් නතර වුණේ නම් A නැමති ස්ථානයේ සිට කියවර කීයක් ඉදිරියෙන් සිටී ද?

(1) කියවර 25 යි. (2) කියවර 50 යි. (3) කියවර 20 යි.


26. පැන්සල හොඳින්සා එක ම රේඛාව දිගේ දෙවරක් නොගොස් ඇඳිය හැකි රූපය කුමක් ද?



(1)



(2)



(3)

27. යෝගට් 5 ක් මිල දී ගත් විට යෝගට් 2 ක් නොමිලයේ ලැබේ. යෝගට් 20 ක් අවශ්‍ය අයෙකු මිල දී ගත යුතු යෝගට් ගණන කීය ද?

(1) 14 යි. (2) 15 යි. (3) 20 යි.

28. දුරකථන ඇමතුම් ලබා ගැනීමට පහසුකම් සපයා ඇති මධ්‍යස්ථානයක පළමු මිනිත්තු පහට රු. 25.00 ක් ද වැඩිවන සෑම මිනිත්තුවකට ම රුපියල් දෙක බැගින් ද අය කරනු ලබයි. මෙම මධ්‍යස්ථානයෙන් රුපියල් 65.00 ගෙවා දුරකථන ඇමතුමක් ලබා ගත් අයෙකු කතා කර ඇති කාලය කොපමණ ද?

(1) මිනිත්තු 30 යි. (2) මිනිත්තු 25 යි. (3) මිනිත්තු 20 යි.

29. පහත සඳහන් සිදුවීම් සලකන්න.

A - ගණන් සාදා මම නින්දට යන විට රාත්‍රී 11.00 වී තිබුණි.
B - උදෑසන 7.10 පමණ වන විට මම පාසලට ගියෙමි.
C - උදෑසන 5.00 ට නැගිට මම පොත් පාඩම් කළෙමි.
D - විවේක කාලයෙන් පසු ව ශිෂ්‍ය සමිතියට සහභාගි වුණෙමි.
E - පාසල නිම වී මම අමතර පන්තියට සහභාගි වුණෙමි.

එම සිදුවීම්වල නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?

(1) ACBDE (2) CBEDA (3) BCDEA

30. සම්මුඛ පරීක්ෂණයක් පෙ.ව. 9.30 ට ආරම්භ විය. සෑම පැය බාගයකට ම වරක් 5 දෙනෙක් ඇතුළට ගන්නා අතර 3 දෙනෙක් සම්මුඛ පරීක්ෂණය අවසන් වී බැහැරට යයි. මධ්‍යහ්න 12.00 වන විට සම්මුඛ පරීක්ෂණය පවත්වන ශාලාව තුළ අසුන් ගෙන සිටින පිරිස කොපමණ ද?

(1) 10 යි. (2) 15 යි. (3) 20 යි.

31. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සිදුවීම සහ එම සිදුවීමට හේතුව ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ගංවතුර ගැලූ නිසා වැස්ස ඇති විය.
(2) නිමාලි පාඩම් කළ නිසා විභාගය ඉහළින් ම සමත් විය.
(3) අව්ව වැටුණු නිසා ඉර පෑයුවේ ය.

32. සමාන්තර පන්ති හතර බැගින් තිබෙන පාසලක 4 ශ්‍රේණියේ අනාවරණ පරීක්ෂණ ප්‍රතිඵල අනුව පළමු ස්ථාන 5 ලබා ගත් ආකාරය පහත දැක්වේ.

4 ශ්‍රේණියේ - පිරිමි - පිරිමි - ගැහැනු - ගැහැනු - පිරිමි

හතර ශ්‍රේණියේ පළමු ස්ථාන තුන අතර සිටි පිරිමි ළමුන් ගණන කීය ද?


(1) 2 (2) 4 (3) 8

33. සිසුන් තිදෙනෙකු ලියන ලද ප්‍රශ්න පත්‍ර 5කට ලබාගත් ලකුණු පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

නම	1 පත්‍රය	2 පත්‍රය	3 පත්‍රය	4 පත්‍රය	5 පත්‍රය
විසල්	63	65	67	69	71
සුනිල්	58	63	68	.....	78
අනිල්	80	77	83	80	.....

වගුවේ සඳහන් තොරතුරුවලට අනුව සුනිල් 4 වන ප්‍රශ්න පත්‍රයට සහ අනිල් 5 වන ප්‍රශ්න පත්‍රයට ලබා ගත් ලකුණු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.


(1) 73 - 80 (2) 83 - 73 (3) 73 - 86

34. 

රූපයේ දැක්වෙන කුඩා ඝනක ගොඩෙහි ඇති මුළු ඝනක ගණන කීය ද?

(1) 12 (2) 9 (3) 7

35. සමචතුරස්‍රාකාර කඩදාසියක් නවා කපා දිග හැර බැලූ විට ලැබුණු ආකාරය දැක්වෙන රූපය පහත දැක්වේ. මෙම හැඩය ලබා ගැනීම සඳහා කැපීමට පෙර එම හැඩය නවා තිබූ ආකාරය දැක්වෙන රූපය හා කැපුම් රේඛා නිවැරදි ව ඇඳ ඇති රූපය කුමක් ද?





(1)



(2)



(3)

36. මිලිමීටර 150 ට වැඩි වර්ෂාවක් නොකඩවා ඇද හැලුණොත් ගාලු නගරයේ මාර්ග ජලයෙන් යට වේ. එවිට ගමනාගමනයට බාධා ඇති වේ. අද දින ගාලු නගරයට මිලිමීටර 150 ක වර්ෂාපතනයක් නොලැබුණි. ඒ අනුව,

(1) ගමනාගමනයට බාධා ඇති විය.
(2) ගමනාගමනයට බාධා ඇති නොවී ය.
(3) මාර්ග ජලයෙන් යට විය.


37. මෙවර සිංහල අලුත් අවුරුද්දට කැවිලි සෑදීම සඳහා අම්මා සීනි ගෙනාවා ය. එහෙත් තාත්තා සීනි යොදා කැවිලි සෑදීම නොකරන ලෙසත් සීනි වෙනුවට භාවිත කළ හැකි දෙයක් ගෙනවිත් දෙන බවත් පැවසුවේ ය. තාත්තා ගෙනවිත් දෙන්නට ඇත්තේ මොනවා ද?

(1) හකුරු (2) කිතුල් පැණි (3) පුවක් පැණි


38. තාත්තා නිවසින් පිටව ගොස් නැවත නිවසට පැමිණියේ සාමාන්‍ය ඔරලෝසුවක පැය කටුව වට 24 ක් ගමන් කළ පසුව ය. තාත්තා නිවසින් පිටව සිටි කාලය දින කීය ද?

(1) දින 1 යි. (2) දින 2 යි. (3) දින 12 යි.


39. මෙම ලී කුට්ටිය A සිට බැලූ විට පෙනෙන ආකාරය ඇතුළත් රූපය තෝරන්න.



(1)



(2)



(3)

40. සිතුම් පන්තියේ පළමුවැනියා වූයේ පැතුම්ට වඩා ලකුණු 18 ක් ලබා ගනිමිනි. පැතුම්ට පමණක් පන්තියේ පළමුවැනියා වීමට නම් තව ලකුණු කීයක් ලබාගත යුතු ව තිබුණේ ද?

(1) 18 යි. (2) 19 යි. (3) 17 යි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Right Reserved



'බෝවිටියා මල් යාය' ඉගෙනුම් නිපුණතා සංවර්ධන වැඩසටහන - 2025

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



5
ශ්‍රේණිය

II පත්‍රය

කාලය :- පැය 1 මිනිත්තු 15

ගුරුවරුන්ගේ භාවිතය සඳහා පමණි.
මෙහි කිසිවක් නොලියන්න.

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

නිපුණතා සංවර්ධන පෙරහුරුවට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ නම මෙම කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

නම :- .....

- මෙම පෙරහුරු පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට තිත් ඉරි මත පිළිතුරු ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

ජාතික මට්ටමේ විභාගයකට ප්‍රථම වරට පෙනී සිටින පුංචි ඔබේ නිපුණතා සංවර්ධනය සඳහා පිදෙන කිළිණයකි.

(01) පහත ඡේදය කියවන්න.

මා කඩේට ගියේ බඩු ගෙන ඒමටයි. ඉතුරු සතේට මුදලාලි දුන්නේ සීනිබෝලයකි. මා එය කටේ දමා ගත්තේ ඉවක් බවක් නැතියකු සේ ය. එවිට මගේ කටට දැනුණේ කොතරම් රසයක් ද? මගේ කටේ ඒ වෙනුවට දැන් ඇත්තේ අප්පිරියාවකි. තිත්ත රසකි. සීනිබෝලය දකින කොට ම මගේ කටට ඉනු කෙළ දැන් හිඳී ගොස් ය. දතෙහි රැඳී ඇත්තේ තිත්ත රසකි. මම හාල් මල්ලෙන් හාල් ඇට කීපයක් කටේ දමා ගත්තෙමි.

ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඡේදයේ සඳහන් ළමයා කඩයට ගියේ කුමකට ද? .....

(ii) ඉතුරු මුදලට මුදලාලි ඔහුට දුන්නේ කුමක් ද? .....

(iii) ඡේදයේ සඳහන් පරිදි සීනි බෝලයක මිල කීය ද? .....

(iv) එය කෑමෙන් පසු ඔහුට දැනෙන්නේ කුමන රසයක් ද? .....

(v) ඔහු හාල් ඇට ලබාගත්තේ කුමකින් ද? .....

(vi) ඉවක් බවක් නැතියකු සේ ඔහු කළේ කුමක් ද? .....

(02) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

සේතං මාමාගේ (පැල / පැළ) අසල නිතර (රිළවු / රිලවු) ගැවසෙති.

(03) පහත ප්‍රස්තාව පිරුළෙහි අදහස තිත් ඉර මත ලියන්න.

කට නිසා ඉබ්බා නැහුණා වගේ.

.....

(04) දෙවියන් බඳු ගුරුන්
පිරිසිදු සිතින් පුදමින්
පිහිටුවා පසඟින්
වඳිමු සැලකිලි කරමු නිතියෙන්

(i) 'ගුරුන්' යන පදයේ අර්ථය වෙනස් කිරීම සඳහා එම වචනයේ මුලට පිලි සහිත අකුරක් යොදා එම වචනය හිස්තැන මත ලියන්න. .....

(ii) 'වඳිමු' යන ක්‍රියාපදය යොදා වාක්‍යයක් ලියන්න. .....

(05) අතීත කාල වාක්‍ය වර්තමාන කාලයට හරවා ලියන්න.

(i) මම ප්‍රබන්ධ කතා රැසක් කියවූවෙමි.

.....

(ii) මුවදෙන ගඟට බැස දිය බිවුවා ය.

.....

(iii) ඔවුහු සතුටින් වේදිකාවෙන් බැස ගියෝ ය.

.....

(iv) නිමල් තරගයට සහභාගී වී ජයග්‍රහණය කළේ ය.

.....

(06) 'සංවිධායක , අන්දරය , ප්‍රස්තාව , කැවුම්' යන පදවලින් පිලි දෙකක් පමණක් යෙදුණ වචන දෙක තෝරා හිස්තැන්හි ලියන්න.

(i) ..... (ii) .....

(07) ගැළපෙන විරාම ලකුණු යොදන්න.

මොක ද වුණේ කියා අපි හැමෝ ම එකවර ඇසුවා

(08) වචන නිවැරදි ව ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

(i) කැපවෙමු / අපි / වෙනුවෙන් / රට / අපේ

.....

(ii) කළ / හෙටට / අද / දේ / නොදමන්න. / යුතු / කල්

.....

(09) ඉරි ඇඳි පදයේ ස්ත්‍රී ලිංග පදය හිස්තැනට යොදා වැකිය සම්පූර්ණ කරන්න.

(i) කුරුල්ලා කූඩුවෙන් පිටවන විට ..... කූඩුවට පැමිණෙයි.

(ii) ඔහු ළඟ ළඟ ම එන බව..... පැවසුවා ය.

(10) පහත සඳහන් තේරවිල්ලෙහි පිළිතුර ලබාගැනීම සඳහා දී ඇති හිස්තැන් සම්පූර්ණ කරන්න.

ගජනාළය


(i) .....

නාළය නම් බටය


(ii) ..... - බත් ඇටය

(11) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

(i)



(ii)



(12) පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) flowers / there ? / How / are / many .....

(ii) grandmother / This / my / is .....

(13) එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Farmer - .....

(ii) Beak - .....

(14) (i) සන්ධෙ (සන්ධ) යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....

(ii) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.


බල්ලා එළියේ ඉන්නවා. .....


(15) 'විසිදහස් පනහ' ඉලක්කමෙන් ලියන්න. .....

(16) (i) රූපයේ පාට කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. .....

(ii) පාට නොකළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.....



(17) 

බදුගේ පිපී ඇති මල්වලින් තුනක් කඩා ඉවත් කළ පසු එහි ඉතුරු මල් ගණන රෝම සංඛ්‍යාවෙන් ලියන්න.


.....

(18) 1, 2, 3, 5, 7, 9, ...රටාවක් සෑදීම සඳහා ඉවත් කළ යුතු සංඛ්‍යාව කුමක් ද? .....

(19) මිදි ගෙඩි 20 කින් $\frac{3}{4}$ ක් හරක් වී ඉවත් කෙරිණි.

(i) හරක් වී ඉවත් කළ මිදි ගෙඩි ගණන කීය ද? .....


(ii) ඉතුරු ව ඇති හොඳ මිදි ගෙඩි ගණන කීය ද? .....

(20) 

මාළුවා දැමූ තැටියට 100 g පඩියක් ද අනෙක් තැටියට 2 kg පඩියක් ද දැමූ පසු තරාදිය දෙපස සමාන ය. මාළුවාගේ බර කොපමණ ද?

..... kg ..... g

(21) ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව ආකාර දෙකකට හිස්තැන් මත ලියන්න.




(i) වේලාව ..... පසු වී මිනිත්තු .....

(ii) වේලාව ..... ට මිනිත්තු .....


(22) දුම්රියක මගීහු 1850 දෙනෙක් ගමන් කරති. පළමු නැවතුමේ දී 25 දෙනෙකු බැස ගියේ ය. 101 දෙනෙකු නැවත දුම්රියට ගොඩ විය. දැන් දුම්රියේ සිටින මුළු මගින් ගණන කොපමණ ද? .....

(23) පහත දැක්වෙන්නේ පාසල් ගේට්ටුවේ සිට එක් එක් ගොඩනැගිල්ල තෙක් දුර දැක්වෙන සටහනකි.





(i) ගේට්ටුවේ සිට විජය ශාලාවට දුර මීටර කීය ද? .....

(ii) කාර්යාලයේ සිට විජය ශාලාවට දුර කොපමණ ද? .....m

(24) 

එක් එක් පිරිසි කෝප්පයක 200 ml බැගින් පාට කළ ජලය පුරවා ඇත. එම සියලු ම පිරිසි කෝප්පවල ජලය මිනුම් සරාවට දැමූ විට මිනුම් සරාවේ ජල මට්ටම පිහිටන ආකාරය නිවැරදි ව සටහන් කරන්න.



(25) 

මේසය මත තබා ඇති ඝනවස්තු දෙස බලන්න. එහි ආනත ව පිහිටි මුහුණත් සහිත ඝනවස්තුවක් වේ. එය නම් කරන්න.

.....

(26) මිල දර්ශනය ඇසුරින් බිල්පතෙහි හිස්තැන් පුරවන්න.

මිල දර්ශනය		
ද්‍රව්‍යය	එකක මිල රු.	සත
පොත	30	00
පෑන	22	50
පැන්සල	18	50
මකනය	16	00

බිල්පත

ද්‍රව්‍යය	ගත් ප්‍රමාණය	ගෙවිය යුතු මුදල රු.	සත
පොත	2	60	00
පැන්සල	2	(i)	.....
මකනය	4	64	00
පෑන	(ii)	67	50

(27) ගසකින් ගෙඩි 4 බැගින් ගස් දහයකින් අඹ කඩා කූඩයට දමා ඇත. ඒවාළමුන් පස් දෙනෙකු අතර සමාන ව බෙදා දුන් විට එක් ළමයෙකුට අඹ ගෙඩි කීයක් ලැබේ ද? .....

(28) පසිඳු උදෑසන එළිමහනට ගොස් නැගෙනහිරට මුහුණලා සිට ගනියි. එවිට ඔහු පිටුපා සිටින්නේ (i) ..... දිශාවට ය. පසිඳුගේ වම් අත ඇති පැත්ත (ii) ..... දිශාව වේ.

(29) මිහිදු ළඟ මීටර 4 සෙන්ටිමීටර 8 ක් දිග ලී පටියක් ද, සෙතුකි ළඟ මීටර 2 සෙන්ටිමීටර 7 ක් දිග ලී පටියක් ද ඇත. ලී පටි දෙකෙහි මුළු දිග කොපමණ ද? .....

- **දී ඇති පිළිතුරු අතරින් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) අප විසින් වචන භාවිත කළ යුතු වන්නේ,

(1) තමාගේ අවශ්‍යතාව ඉටු කර ගැනීමට පමණක් ය.


(2) අන් අයගේ සිත් නොරිදෙන පරිදි අන් අයට තරහ ඇති නොවන පරිදි ය.

(3) අන් අය පවසන දෙය ගැන පමණක් සිතා ය.


(31) මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි ආගමික නොවන ඓතිහාසික ස්ථානයකි,

(1) දඹුලු විහාරය (2) මාතලේ අලුවිහාරය (3) සීගිරිය

(32) හිස ගැල්වීම සඳහා නිවසේ දී සාදා ගන්නා පොල්තෙල්වල සුවඳ වහනය වීම සඳහා ඖෂධීය පැළෑටියක මුල් භාවිත කරනු ලැබේ. එම පැළෑටිය තෝරන්න.



(1)



(2)



(3)

(33) බීජ ව්‍යාප්තියට උදවු කරන සතුන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) වවුලා / උගුඩුවා (2) මී මැස්සා / රිළවා (3) වඳුරා / සමනලයා

(34) පාසල සතු උපකරණ හා භාණ්ඩ පිළිබඳ ව සටහන් කර ඇති පොත කුමක් ද?

(1) ලොග් සටහන් පොත (2) බඩු වට්ටෝරු පොත (3) පන්ති චාර්තා පොත


(35) එක් එක් පුද්ගලයකු ලබා ගත යුතු ආහාර අවශ්‍යතා වෙනස් වීම කෙරෙහි බලපාන හේතුවක් නොවේ.

(1) කරන රැකියාව අනුව (2) වයස අනුව (3) ස්ත්‍රී පුරුෂ භාවය අනුව


(36) ළමා හිංසනය පිළිබඳ ව දැනුම් දීමට භාවිත කරනු ලබන දුරකථන අංකය කුමක් ද?

(1) 1990 (2) 1920 (3) 1929


(37) 'සත්වෙත් මහත් අදර ලත් යුත් - සිදත් කුමරු' යන වන්නමට අදාළ වනුයේ කුමන සතාගේ ගමන් විලාසයක ද?



(1)



(2)




(3)

(38) රත් වූ ජල වාෂ්ප සිසිල් වීම තුළින් ලැබෙන්නේ,

(1) අයිස් කුට්ටි (2) ජලය (3) ජල වාෂ්ප

(39)



රූපයේ දැක්වෙන A නැමැති ස්ථානයේ සවි කර තිබෙන්නේ කුමක් ද?

(1) යකඩ කැබැල්ලක්

(2) චුම්බකයක්

(3) සෘජුගෝම් කැබැල්ලක්

(40) 3R සංකල්පයට අයත් නොවන්නේ මින් කුමක් ද?

(1) භාවිතය අවම කිරීම. (2) ප්‍රතිචක්‍රීකරණය කිරීම. (3) වර්ගීකරණය කිරීම.

(41) පදිකයින් පාර මාරුවීම සඳහා වන සංඥා පුවරුවේ රතු වර්ණයෙන් මිනිසෙකුගේ රූපය දිස්වන විට පදිකයින් කළ යුතු වන්නේ කුමක් ද?

(1) පාර මාරුවීම. (2) වාහන නැත්නම් පාර මාරුවීම.


(3) පාර මාරු නොවී සිටීම.

(42) නිරෝගී පුද්ගලයෙකුගේ මුත්‍රාවල වර්ණය තද පැහැයක් ගැනීමට හේතුව කුමක් විය හැකි ද?


(1) අධික ලෙස ජලය පානය කිරීම. (2) ප්‍රමාණවත් පරිදි ජලය පානය නොකිරීම.

(3) වැඩි කාලයක් අසුන් ගෙන සිටීම.


(43) කාබෝහයිඩ්‍රේට් පෝෂ්‍ය පදාර්ථය අඩංගු ආහාර වර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.



(1)




(2)



(3)

(44)



රූපයේ දැක්වෙන්නේ ජන ක්‍රීඩාවක් සඳහා භාවිත කරන පුවරුවකි. එය හඳුන්වනු ලබන නම කුමක් ද?

(1) ඔලිඳ පෙත

(2) බට්ටා පැනීම

(3) පංච පෙත

(45) කුරක්කන් , මුං , කටු අනෝදා යන බීජවල පැහැය පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) කොළ , කළු , දුඹුරු (2) දුඹුරු , සුදු , කොළ (3) දුඹුරු , කොළ , කළු

(46) වර්තමානයේ පාරිභෝගිකයින් සුපිරි වෙළෙඳසැල්වල ගනුදෙනු සඳහා මුදල් නෝට්ටු වෙනුවට බහුල ව භාවිත කරනු ලබන දේ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ක්‍රෙඩිට් කාඩ් , වීසා කාඩ් , ඩෙබිට් කාඩ්
(2) චෙක්පත් , වීසා කාඩ් , කාසි
(3) කාසි , වවුචර්පත් , ඩෙබිට් කාඩ්

(47) රිය පැදවීමේ දී සිදුවන වැරදි වෙනුවෙන් සාමාන්‍ය දඩ මුදල් ගෙවීම සඳහා අප යා යුතු වනුයේ කුමන ස්ථානයකට ද?

(1) පොලිසියට ය. (2) තැපැල් කාර්යාලයට ය. (3) උසාවියට ය.

(48) වෙළෙඳ දැන්වීම් මගින් සිදුවන යහපත් ප්‍රතිඵලයකි.

(1) නව ආහාර වර්ග පිළිබඳ ව දැනුවත් වීම. (2) අනවශ්‍ය දේ මිල දී ගැනීමට පෙලඹීම.
(3) අනවශ්‍ය ලෙස මුදල් වැය වීම.

(49) පාසලේ පැවැත්වෙන ප්‍රථමාධාර වැඩ සටහනක් සඳහා සහය ලබා ගත හැකි ආයතන ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) රතු කුරුස සංවිධානය / ශාන්ත ජෝන් ගිලන් රථ සේවය
(2) ග්‍රාම නිලධාරී කාර්යාලය / රතු කුරුස සංවිධානය
(3) සුව සැරිය ගිලන් රථ සේවය / පොලිසිය

(50) පහත සඳහන් ඒවා අතුරින් එක ම කාණ්ඩයට අයත් නොවන පදයක් සහිත පිළිතුරු තෝරන්න.

(1) කොඩි එසවීම , හූ කීම , කට කතා
(2) සතුන් මගින් , අණ බෙර වැයීම , ගිනි ගොඩක් ගැසීම.
(3) පණිවිඩකරුවන් , පුවත්පත් , කුරුල්ලන් මගින්

(51) ඒදිනෙදා ජීවිතයේ දී සුබ පැතීම් සිදු කරනු ලබන අවස්ථාවක දී සුබ පැතුම් පත් භාවිත කිරීම නිසා අත්වන වාසියක් නොවන්නේ,

(1) මිතුදම් ශක්තිමත් වීම.
(2) සුහදතාව පලුදු වීම.
(3) අන්‍යයගේ ගෞරවයට පාත්‍ර වීම.

(52) පහත ස්ථාන අතුරින් බෝලයක් පහසුවෙන් හා අපහසුවෙන් පෙරළීම පිළිවෙළින් සිදු වන්නේ,


A - වැලි සහිත බිමක්
B - සිමෙන්ති බිමක්
C - පිඟන් ගඩොල් ඇල්ලූ බිමක්
D - බොරලු සහිත බිමක්

(1) B සහ D ය. (2) D සහ A ය. (3) C සහ D ය.

(53) දෙමාපියන්ට නොසලකන දරුවන් අද සමාජය තුළ දැකිය හැකිවීම සමාජ පරිහානියට හේතුවන කරුණකි. මේ පිළිබඳ ව කියවෙන කවි පදයක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) 'බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට'
(2) 'මේ ගසේ බොහෝ පැණි දොඩම් තිබේ'
(3) 'ඇයි අම්මේ අඬන්නේ මේ කඳුළු සලා'

(54) පහත රූප සටහන මගින් දක්වා ඇති ක්‍රීඩාව,



(1) රවුම මතින් බෝලය දමමු. (2) රවුම මතින් බෝලය ගනිමු.

(3) බෝලය ගෙන යමු රවුමෙන් රිංගමු.

(55) ඔරිගාමී කලාවට උදාහරණයකි.


(1) කඩදාසියක් නවා සාදන බෝට්ටුව (2) ගොක්කොළයකින් සෑදූ නළාව

(3) පොල්පිත්තෙන් සෑදූ හරකා

(56) "ඉරු දෙවියන්ගේ ඉර ගල ගාවා" සහ "ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට" යනු සීපද දෙකක මුල් පද දෙකකි. එම කවි දෙක කුමන ජන කවි වර්ගවලට අයත් වන්නේ දැයි පිළිවෙළින් අඩංගු නිවැරදි පිළිතුර වනුයේ,

(1) පාරු කවියක් හා කරත්ත කවියක් (2) ගොයම් කවියක් හා පතල් කවියක්

(3) නෙළුම් කවියක් හා කරත්ත කවියක්

(57) 

රූපයේ දක්වා ඇති පාපැදියක දැති රෝද සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) A එක් වටයක් කරකවන විට B වට කිහිපයක් කරකැවීම.


(2) B එක් වටයක් කරකවන විට A වට කිහිපයක් කරකැවීම.

(3) A හා B සමාන වට ගණනක් කරකැවීම.

(58) රත් වූ ලෝහ හැන්දක් මතට ජල බිංදුවක් දැමීමේ දී ජල බිංදුව නොපෙනී ගියේ ය. එයට හේතුව විය හැක්කේ,

(1) ලෝහ මගින් ජලය උරා ගැනීම. (2) ජල බිංදුව වාෂ්ප වීම.

(3) ජලය ඉහළ සිට පහළට ගලා යාම.

(59) 

පාසල් සිසු කණ්ඩායමක් හිරු එළියේ වර්ණ පරීක්ෂා කිරීම සඳහා රූප සටහනේ දැක්වෙන පරීක්ෂණයෙහි නිරත වූහ. එහි A අක්ෂරයෙන් ජල බේසම දක්වා ඇති අතර B අක්ෂරයෙන් දක්වා ඇත්තේ,

(1) සුදු පැහැති කඩදාසියකි. (2) යකඩ තහඩුවකි. (3) තල දර්පණයකි.

(60) දින කීපයක් තිස්සේ ඇද හැලුණු අධික වර්ෂාව නිසා ගඟ උතුරා ගොස් පහත් බිම් ජලයෙන් යට විය. ගම්වැසියන්ගේ නිවාසවලට ද අලාභ හානි සිදුවිය. වර්ෂාව නිසා සතුන්, වගාවන් සහ මිනිසුන්ට සිදු වූ බාධා පිළිබඳ ව සැලකිලිමත් වී "ගංවතුරෙන් ගමට සිදු වූ හානි" යන මාතෘකාවට අදාළ ව උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි වචන පහකට නොඅඩු වාක්‍ය තුනක් ලියන්න.

(1) .....

.....

(2) .....

.....

(3) .....

.....